**ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යනය) - 2018**

-----------------------------------------------------------------------------

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යයනය) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 දෙසැම්බර් 14 දින එළඹි අංක එස්ආර්අයි -2767 දරන ණය ගිවිසුමේ ii වාවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ජාතික මහාමාර්ග කිලෝමීටර් 62 ක් පමණ වැඩිදියුණු කිරීම පුනරුත්ථාපනය කිරීම් හා යළි සම්බන්ධ කිරීම් මගින් ජාතික ප්‍රවාහන කාර්යක්ෂමතාවය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,278 කට සමාන එ.ජ.ඩො. මිලියන 105.60 ක් වූ අතර ඉන් රු. මිලියන 11,050 කට සමාන එ.ජ.ඩො මිලියන 85 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ එවක ක්‍රියාත්මක කරන ලද ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍ය සැපයීමේ අරමුණින් සහ එය 2017 සැප්තැම්බර් 11 අවසන් කරන ලදි.මෙම ව්‍යාපෘති දෙකම එක් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයක් විසින් පාලනය කලා වුවද, 2017 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්ථා අදාල ව්‍යාපෘති විසින් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2011 දෙසැම්බර් 31 දින ආරම්භ කළ අතර 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂිත වූ අතර 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

------------------------------

මාගේ වාර්තාවේ 2.1 ජේදයේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

------------------------

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 කළමනාකරණයේ වගකීම් සහ මූල්‍ය ප්‍රකාශණ පාලනය පිළිබඳ චෝදනා

---------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම පාලනය සම්බන්ධයෙන් චෝදනා ලද අය සතුවේ.

ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාරතා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස්

-------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීම.

-------------------------------------

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමණානරණයේ අදහස් දැක්ම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2017/12/31 දිනට අවසන් කර තිබුණා වුවද ක්‍රියාත්මක කරවන ආයතනය විසින් ව්‍යාපෘතියේ වත්කම් අදාල ක්‍රියාත්මක කරන ආයතන වලට භාර දීමට සහ මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී නොතිබුණි. ව්‍යාපෘතියේ එහි කටයුතු 2018 දෙසැම්බර් 31 දක්වා අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස ණය ගිවිසුමේ සඳහන් ව්‍යාපෘතියේ කටයුතු සීමා කිරීම සඳහා ඇතුලත් කරන ලද සීමාවන නොසලකා ප්‍රවර්ථන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම සංකල්පය මත පදනම්ව පිළියෙලකර තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති වැරදි අයුරින් ආදේශ කර ඇත. | ප්‍රතිචාර නොමැත. | ව්‍යාපෘතියේ කටයුතු අවසන්කළ වහාම සියළුම ව්‍යාපෘතින්ගේ වත්කම් හා වගකීම් ක්‍රියාත්මක කරන ආයතනය වෙත මාරු කිරීම සහ අවසන් කිරීමේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කටයුතුවල භෞතික කාර්ය සාධනය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, හික්කඩුව සහ අළුත්ගම සිට දක්ෂිණ අධිවේගී මාර්ගයට සෘජුවම සම්බන්ධවන ජාතික මාර්ග 2කට සහ මාතර - ගොඩගම මාර්ගය, කටුකුරුන්ද - නාගොඩ මාර්ගය, නුගේගොඩ - හෝමාගම මාර්ගය හා පාමංකඩ - කැස්බෑව මාර්ගය සහ වෙනත් ජාතික මාර්ග 4කට අයත් කිලෝමීටර් 62ක් තත්වයෙන් උසස් කිරීමට සහ පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වෙතත් 2016 දෙසැම්බර් 31 වන විට එම මාර්ග වලින් කිලෝමීටර් 55.72ක ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණයකර තිබුණි.

මාතර - ගොඩගම මාර්ගයේ ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය කිරීමේ කටයුතු සැලසුම් කළ අයුරින් ඉටු කළ අතර තුර අනෙකුත් මාර්ගයන් දින 172 සිට දින 338 ප්‍රමාදයක් සහිතව අවසන්කර තිබුණි.

3.2 **මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| **විගණනයේ බලපෑම** | **සාධකය** | **කළමනාකරණ ප්‍රතිචාරය** | **විගණකගේ නිරීක්ෂණ** |
|---|---|---|---|
| දකුණු පලාතේ ගාල්ල බද්දේගම මාර්ගයේ කිලෝමීටර17.6ක් ප්‍රතිසංස්කරණයට ඉඩම් අත්පත්කර ගැනීම සඳහා රුපියල් මිලියන 18.33ක් වියදම්කර තිබුණා වුවත් ඉහත මාර්ග කොටසේ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතියේ විසින් දරණ ලද මුදල් වෙනත් අරමුණු ලගාකර ගැනීම සඳහා භාවිතාකර ඇත. | මෙම මාර්ගය සංයුක්ත සැලැස්ම තුල ප්‍රමුඛ මාර්ගයක් විය. අරමුදල්වල සීමා සහිතබව නිසා මාර්ගයන්ගේ නැවතඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක නොවීය. කෙසේ වෙතත් අත්පත් කර ගත් ඉඩම් අනාගතයේ මෙම කාර්ය සඳහා භාවිතා කරනු ඇත. | ව්‍යාපෘතියේ විෂය පථය ඇතුලත් කිරීම අවශ්‍ය වේ. |

3.3 **ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටළු**

--------------------------------------

| **විගණනයේ බලපෑම** | **සාධකය** | **කළමනාකරණ ප්‍රතිචාරය** | **විගණකගේ නිරීක්ෂණ** |
|---|---|---|---|
| ලබා දී ඇති තොරතුරු අනුව, රජයේ ඉඩම් කැබිලි 1535ක් ඇත්ලත්ව ඉඩම් කැබලි 7082ක් අත්පත්තර ගැනීම සැලසුම් කරන ලද අතර මුළු ඉඩම් අතරින් අත්පත්කර ගැනීමේ පනතේ 17වන වගන්තිය යටතේ ඉඩම් කැබලි 4343ක් සඳහා රුපියල් මිලියන 1933ක් සඳහා වන්දි ගෙවා තිබුණි. තවද ඉඩම් අත්පත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුවේ තීරණයක් අනුව අතිරේකව රුපියල් මිලියන4134ක් ගෙවා තිබුණි. එයට අමතරව 2018 දෙසැම්බර් 31 දක්වා රුපියල් මිලියන379.44ක මුදලක් වන්දි ගෙවීමට ප්‍රමාදවීම සඳහා පොලී වශයෙන් ගෙවා තිබුණි. 1986 අංක 13 දරණ ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44වන වගන්තිය ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය 2018 දෙසැම්බර් 31 දින වන විට වුවත් අවසන් නොතිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීමේ ගැටළු හා අමතර පිරිවැයක් දැරීමට සිදුවිය හැකිය. | ඉඩම් පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු 2009 වර්ෂය තුල ආරම්භකර තිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධව අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. |